අකුරණ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු රු.1,850,000ක් වටිනා ඉඩමක් හා වටිනාකම තක්සේරු නොකළ ඉඩම් 3 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැළපීමට කටයුතු කරමි. |
| (ii) | සභාව සතු ප්‍රජා ශාලා 03 ක් හා කඩ කාමරයක් ඉදි කිරීම සඳහා දරා තිබූ රු.653,917 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැළපීමට කටයුතු කරමි. |
| (iii) | ලැබිය යුතු රු.24,500 ක් හා ගෙවිය යුතු රු.100,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැළපීමට කටයුතු කරමි. |
| (iv) | කසළ දාහකයක් මිලදී නොගෙන, රු.1,003,800 ක මුදලක් ප්‍රාග්ධන වියදම් හර කර ණය හිමියෝ බැර කර තිබුණි. | ණයහිමියෙක් නොමැතිව ණයහිමි වෙන් කළ නොහැකි වේ. | කසළ දාහකයක් අත්‍යවශ්‍ය බැවින් මෙම මුදල ණයහිමි කර ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැළපීමට කටයුතු කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වසර 1-5 ත් අතර කාලයක් ඉක්මවූ ණයගැති වටිනාකම රු.368,792 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 1 – 3 ත් අතර ණයගැති වටිනාකම රු.175,022 කි. |
| (ii) වසර 1 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.3,539,321 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 1 – 5 ත් අතර ශේෂය රු.395,557 ක් බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| (i) 52 වගන්තිය | නීති රීති උල්ලංඝනය කරමින් මාර්ග හා ඔය රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් වාර්තා වී ඇතත්, ඒ සඳහා ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | නීති රීති අනුව අනවසර ඉදිකිරීම් නැවැත්වීමට පියවර ගෙන නොතිබුණි. | මාර්ග රක්ෂිත, ඔය රක්ෂිත, සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියට පැවරී ඇත. |
| (ii) 126 vii (ඊ) වගන්තිය | දැන්වීම් පුවරු 76 ක් සඳහා රු.253,400 ක ගාස්තු අයකර නොතිබුණි. | වාර්ෂික සමීක්ෂණය මඟින් අය කිරීම් කළ යුතුවේ. | 2018 වර්ෂයේ රු.603,490 ක් අයකළ අතර මුදල් නොගෙවන දැන්වීම් පුවරු සඳහා ලිපි මඟින් දන්වා ඇත. |
| (ආ) 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් පත්‍රයේ පලකර ඇති 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) | ප්‍රවාහනය කර තිබූ මස් වෙනුවෙන් රු.1,769,000 ක ගාස්තුවක් අයකර නොතිබුණි. | පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පරීක්ෂා කරන ලද මස් සඳහා ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

පනතේ 32(9) වගන්තිය

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 ක් ඉක්මවූ රු.518,953 ක් වටිනා තැන්පතු 52 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පතු 52 කට අදාළ රු.518,953 ක මුදල සඳහා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |
| (ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය | දින 180 ක සතුටුදායක සේවා කාලයක් නොතිබියදී සේවකයන් දෙදෙනෙකු ස්ථිර කර රු.2,967,855 ක් වැටුප් ගෙවා තිබුණි. | විධිමත්ව පත්වීම් සිදු කළ යුතුවේ. | බඳවාගෙන ඇති අභ්‍යාසලාභීන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකරන බව දන්වමි. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහන 19 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු වාහන කීපයක ඉන්ධන දහනය පරීක්ෂා කළ බව දන්වමි. |
| (ඉ) අංක එන්පී/ආර්ටීසී/ටීආර්/සීඑම්/12/07 දරන 2012 සැප්තැම්බර් 5 දිනැති ත්‍රී රෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා වැඩපිළිවෙළක් හඳුන්වා දීම නැමැති අමාත්‍ය මණ්ඩල සංදේශය | ත්‍රිරෝද රථ සේවාව විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් කළ යුතුවේ. | ත්‍රිරෝද සේවාව නියාමනය කිරීමට කටයුතු කර ඇත. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තියට අනුකූල නොවී සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවෙන් රු.79,002 ක වියදමක් දරා තිබුණි. | අධිකාරි බලය ලබාගෙන වියදම් කළ යුතු වේ. | අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,044,348 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,165,502 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,987,300 | 6,072,632 | 5,001,338 | 1,071,292 | 5,987,300 | 5,996,872 | 4,880,388 | 2,398,816 |
| (ii) | කුලී | 1,255,800 | 3,322,006 | 3,180,701 | 141,305 | 3,423,000 | 3,683,339 | 3,571,123 | 113,435 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,500,000 | 3,016,850 | 3,016,850 | - | 2,200,000 | 2,369,650 | 2,369,650 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,700,000 | - | - | 12,700,000 | 12,200,000 | - | - | 12,200,000 |
| | | 22,443,100 | 12,411,488 | 11,198,889 | 13,912,597 | 23,810,300 | 12,049,861 | 10,821,161 | 14,712,251 |

#### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.27,123,739 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.11,198,889 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 41 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.296,909 ක් හා මුද්දර ගාස්තු රු.19,340,215 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ දඩ මුදල් අයකර ගැනීමට ලිපි මඟින් දැනුම් දී ඇති අතර මුද්දර ගාස්තු උපලේඛන ලබාදීමේ ප්‍රමාදයක් ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයා ගත හැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සැලසුම් කළ ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 24 ක් ඉටු කළ නොහැකි වී තිබුණි. | සැලසුම්ගත කාර්යයන් ඉටු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම අඩුපාඩු සකස් කර ගන්නා බව දන්වා සිටිමි. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික අයවැය මඟින් කර්තව්‍යන් 16 ක් සඳහා රු.4,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද එකී කර්තව්‍යයන් ඉටුකර නොතිබුණි. | අයවැයගත යෝජනා ක්‍රියාත්මක කළ යුතුවේ. | ගරු මහජන නියෝජිතයින් ඉදිරිපත් කල යෝජනා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ දිරන හා නොදිරන ලෙස වෙන්කර ලබා ගැනීමක් සිදු කර නොතිබුණි. | විධිමත්ව කසළ කළමනාකරණය කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඉ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඔය හරහා ගමන් කිරීම සඳහා පෞද්ගලික පාලම් ඉදිකිරීමට අවසර දී තිබීම, ඔය රක්ෂිතයට ප්‍රමාණවත් තරම් ඉඩ නොතබා නිවාස ඉදි කිරීම හා බොහෝ නිවාසවල කොන්ක්‍රීට් කණු ඔය තුළ ඉදිකිරීම පිහා ඔය පිටාර ගැලීමට හේතු වී තිබුණි. | අවිධිමත් ඉදිකිරීම් වැළැක්වීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත ඇල හරහා පාලම් ඉදිකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර විසඳුමක් ලබා ගනිමි. |

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇත. ක්‍රියාත්මක සැලැස්ම සම්පාදනය කර මැන බැලීම සිදුවන බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | තනතුරු එකක අතිරික්තතා 2 ක් හා තනතුරු 8 ක පුරප්පාඩු 20 ක් විය. | සේවක අතිරික්තතා වළක්වාගෙන පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | වසර 10 කට පෙර සභාවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.39,875 ක ණය ශේෂයක් පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | මහා සභාවට යොමුකර සහා අරමුදලෙන් කපා හැරීමට කටයුතු කිරීම. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ තක්සේරුව මත 2018 වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | වර්ෂ 5 කට වරක් බදු මුදල් සංශෝධනය කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා මෙම කාර්යය අතපසු වී ඇත. |
| (ආ) | සභාව විසින් 2017 හා 2018 වර්ෂවල අනුකූලතා සහතික 24 ක් නිකුත් කර තිබුණද, තාවකාලික තක්සේරුවක් මත වරිපනම් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තාවකාලික තක්සේරුව මත හෝ වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | කොටසක් වරිපනම් කලාපයෙන් පිටත පිහිටා ඇත. අනෙකුත් ස්ථාන සඳහා තාවකාලිකව තක්සේරු කිරීමට පියවර ගනිමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අකුරණ නගරයේ ස්ථාපිත කඩ කාමර 35 කින් යුත් අකුරණ පොදු වෙළඳ සංකීර්ණය ඉදිකර වසර 30 ක් ගතවුවද, අළුත්වැඩියා කර සුදුසු තත්ත්වයට පත්කර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර කටයුතු කිරීමට නුසුදුසු තත්වයේ ඇති බැවින් ලැබෙන ආදායම අඩුය. |

3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.17,649,179 ක් වටිනා මෝටර් ග්‍රේඩරය හා රු.2,000,000 ක් වටිනා එක්ස්කැවේටර් යන්ත්‍රය උපයෝජනයකින් තොරව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙය අනවශ්‍ය බව පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | පිළිගතිමි. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගලේකඩේ සිට මාවතුපොල දක්වා පන්සල මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා රු.166,625 ක් වටිනා ද්‍රව්‍ය ආධාර ලබා දී තිබූ නමුත් එම මාර්ගයේ තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් නොතිබුණි. | පරීක්ෂණ වාර්තාව ලබාගත යුතුවේ. | තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට උපදෙස් දී ඇත. |